ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මුදල් සමාගම් විමසුම් ඇසින්...

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත (මුදල් ව්‍යාපාර පනත) යටතේ "මුදල් ව්‍යාපාර" කටයුතු පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය (එවකට මුදල් මණ්ඩලය) වෙතින් බලපත්‍රයක් ලබා, මුදල් ව්‍යාපාර කටයුතු කරන ආයතන මුදල් සමාගම් ලෙස හැඳින්වෙයි.

එම පනතට අනුව, "මුදල් ව්‍යාපාර" යන්නෙන්, තැන්පතු භාරගැනීමේ  ව්‍යාපාරය සහ (අ) මුදල් ණයට දීම; හෝ (ආ) යම් කවර ආකාරයකින් හෝ මුදල් ආයෝජනය කිරීම; හෝ (ඇ) යම් කවර ආකාරයකින් හෝ මුදල් ණයට දීම හෝ මුදල් ආයෝජනය කිරීම අදහස් වේ.

## මුදල් ව්‍යාපාරවල ආර්ථික වැදගත්කම

අප එදිනෙදා ගනුදෙනු සිදු කිරීමේ දී බලපත්‍රලාභී බැංකු (වාණිජ හා විශේෂිත) සහ මුදල් සමාගම් විසින් මූල්‍ය අතරමැදිකරණයේ නිරත වෙමින් විශාල කාර්යභාරයක් කෙරෙයි. එනම්, මහජන තැන්පතු භාර ගනිමින් සහ එම තැන්පතු ඵලදායී ආයෝජන මාර්ගවල යෙදවීමෙන් ලබන ප්‍රතිලාභ භාවිත කරමින්, තැන්පත්කරුවන්ගේ තැන්පතු මුදල් සහ ගිවිසගත් පොලිය ආපසු ගෙවීම තුළින් ඔවුහු මූල්‍ය අතරමැදිකරණයේ යෙදෙති. මෙලෙස අතරමැදිකරණයේ නිරතවන ඕනෑම මූල්‍ය ආයතනයකට සිය අවදානම කළමනාකරණය කිරීමට සිදුවේ. එනිසාම ලොව සෑම ආර්ථිකයක ම පාහේ මූල්‍ය අතරමැදිකරණයේ නියුතු ආයනන යම් නියාමන අධිකාරියක් විසින් අධීක්ෂණය කරනු ලබයි.

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ මූල්‍ය අතරමැදිකරණය ප්‍රධාන වශයෙන් සිදු කෙරෙනුයේ බලපත්‍රලාභී බැංකු විසින් වුව ද, මුදල් සමාගම්වල පැවැත්මද ආර්ථිකයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා අතිශය වැදගත් වේ. බොහෝවිට, ආර්ථිකයක ඉහළ ම ණය ගෙවීමේ හැකියාව ඇති පිරිස බැංකු ආයතන විසින් ආකර්ෂණය කරගනු ලැබුවද සාපේක්ෂ ව අස්ථාවර/අක්‍රමවත් ආදායම් ලබන සහ පිළිගත හැකි ඇප සුරැකුම් ඉදිරිපත් කළ නොහැකි ආයතන සහ පුද්ගලයින්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටුකරලීම සඳහා මුදල් සමාගම් වඩාත් නම්‍යශීලී ස්වරූපයකින් කටයුතු කරයි.

එමෙන් ම, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී මුදල් සමාගම් වර්තමානය වන විට සෘජු සහ වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය කරමින් ආර්ථිකයේ සේවා නියුක්තිය වැඩි කිරීමටද දායකත්වයක් ලබා දී ඇත.

## මුදල් සමාගම්වල ආයෝජනය කිරීමේ හෝ තැන්පත් කිරීමේ අවදානමක් පවතීද?

රජයක් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් හැරුණු විට අනෙකුත් සියලු ම ආයෝජනයන්හි යම් අවදානමක් ඇති බව අප කවුරුත් දන්නා කරුණකි. නමුත්, නියාමන අධිකාරියක් මඟින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල ආයෝජන සිදු කිරීම පිළිබඳ ව වැඩි මහජන විශ්වාසයක් පවතී.

නියාමන අධිකාරියක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති විධිවිධාන සහ රෙගුලාසිවලට අනුකූල ව කටයුතු සිදු කිරීම නිසාත් මුදල් සමාගම්වල ඇති අවදානම් සහ දුර්වලතා හඳුනාගැනීම හා නිවැරදි කිරීමේ ක්‍රමවේද කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීම නිසාත් නියාමනයට ලක්වන මුදල් සමාගම්වල ඇති අවදානම සාපේක්ෂ ව අවම මට්ටමක පවතී.

මුදල් සමාගම් විසින් ස්වකීය ව්‍යාපාරික කටයුතුවලට අදාළ ව්‍යාපාරික තීරණ ස්වාධීන ව ගනු ලබන අතර එම මෙහෙයුම් තීරණ කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුව බලපෑම් සිදු නොකරයි. නමුත්, මෙම ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන නියෝග, විධිවිධාන හා රෙගුලාසිවලින් සමන්විත නීතිමය රාමුවක් තුළ කටයුතු කිරීම අනිවාර්ය වේ. එමෙන් ම, එම ආයතනවල කළමනාකාරිත්වය විසින් ගනු ලබන මෙහෙයුම් තීරණවලින් ඇතිවන බලපෑම් සඳහා වග කියනු ලබන්නේ එම ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

මේ අනුව, ලොව පුරා පවතින නියාමන අධිකාරීවලට පොදු තත්ත්වයක් ලෙස, නියාමනයට යටත්වුවද එම ආයතනයන් හි ආයෝජනය කිරීම හෝ මුදල් තැන්පත් කිරීම ඉඳුරාම අවදානමෙන් තොර බවට සහතික කිරීමට කිසිදු නියාමන අධිකාරියකට  හැකියාවක් නොමැති බව දැක්විය හැකිය.

ඉහත අවදානම යම් ප්‍රමාණයකට කළමනාකරණය කිරීමක් ලෙස ලොව පුරා ක්‍රියාත්මක වන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද එහි අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල තැන්පතුකරුවන් වෙනුවෙන් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව, දැනට පවත්නා නීතිමය ප්‍රතිපාදන අනුව, මෙවැනි ආයතනයක බලපත්‍රය අවලංගු කිරීමට තීරණය කරනු ලැබුවහොත් එම ආයතනයෙහි සියලු රක්ෂිත තැන්පත්කරුවන් සඳහා පවත්නා නීති රීතිවලට යටත්ව මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මගින් එක් තැන්පත්කරුවෙකුට උපරිමය රුපියල් ලක්ෂ එකොළහකට  (රුපියල් 1,100,000.00) යටත්ව රක්ෂණ වන්දි මුදලක් සඳහා හිමිකම් පෑ හැකිය.

## මුදල් සමාගමක ආයෝජනය/තැන්පතුවක් කිරීමේ දී හෝ වෙනත් සේවාවක් ලබාගැනීමේ දී  සැලකිය යුතු කරුණු

ඉහත දැක්වූ පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක්වන මුදල් සමාගම් සම්බන්ධව අවශ්‍යතාව පරිදි විවිධ නියාමන ක්‍රියාමාර්ග හෝ නියාමන සීමාවන් හෝ පැනවීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි. ඒ පිළිබද තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය (www.cbsl.gov.lk) තුළ ප්‍රසිද්ධ කරනු ලබන අතර අවශ්‍යතාව පරිදි එම තොරතුරු වෙනත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා ද ප්‍රසිද්ධියට පත් කෙරේ.

ඒ අනුව යම් මුදල් සමාගමක් සමග ගනුදෙනු කිරීමට පෙර ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් සීමා කිරීමක් කරනු ලැබ තිබේද, එසේ නොමැතිනම් යම් වෙනත් ප්‍රසිද්ධ තොරතුරු පවතීද යන්න පිළිබඳව දැනුවත් වීම වැදගත් වේ.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලබාගත් මුදල් සමාගම් විසින් සිය විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා ද, වෙනත් අර්ධ වාර්ෂික ගිණුම් වාර්තා ද ප්‍රසිද්ධ කිරීම අනිවාර්ය කර ඇති අතර මුදල් සමාගමක් සමග ගනුදෙනුවකට එළඹීමට පෙර එම ගිණුම් වාර්තා පරිශීලනය කිරීම ද සිය අවදානම අඩු කර ගැනීමට ඉවහල් වේ.

මෙලෙස සිය මුදල් ආයෝජනය කරන ආයතන පිළිබඳ විමසිලිමත් වන අතර ම ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට ලක් නොවන, බලපත්‍රලාභී නොවන මූල්‍ය ආයතනයන්හි මුදල් තැන්පත් කිරීමෙන් වැළකීම ද පුරවැසි සැමගේ වගකීමක් වේ.